# 21. සහජීවනයෙන් ක්‍රියා කරමු

**ශ්‍රී ලංකාව බහු ආගමික හා බහු ජාතික ජන කොට්ඨාසවලින් සමන්විත ය. අප රට තුළ ඇත්තේ විවිධ ආගම් හා විවිධ සංස්කෘතීන්ට ගරු කරන මිනිස් සමාජයකි .එබැවින් රට තුළ සහජීවනයෙන් ජීවත් වීම සඳහා සෙසු ආගම් හා ඒවාට අයත් ලියවිලි පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

කිතුනු දරුවන් වන අපට ශුද්ධ බයිබලය පූජනීය ග්‍රන්ථය වන්නා සේ ම බෞද්ධයින්ට ත්‍රිපිටකය ද ඉස්ලාම් භක්තිකයින්ට කුරාණය ද හින්දු භක්තිකයින්ට වේද ග්‍රන්ථය ද වැදගත් වේ. සෑම ආගමකට ම හා ඊට අයත් ලියවිලිවලට ගරු කරමින් කටයුතු කිරීම කිතුනු දරුවන් තුළ තිබිය යුතු යහපත් ගුණාංගයකි. එමෙන් ම, සෑම ආගමික ග්‍රන්ථයක් මගින් ම ඉදිරිපත් කෙරෙන දහම් ඉගැන්වීම් පිළිබඳව මූලික අවබෝධයක්වත් ලබා තිබීම ආගමික සහජීවනයට වැදගත් වනු ඇත.

එබැවින් වෙනත් ආගමික ශාස්තෲවරුන් විසින් ප්‍රකාශ කළ දහම් පණිවුඩය හා දර්ශනය පිළිබඳව දැන ගැනීමට අපි දැන් යොමු වෙමු.

## බෞද්ධ දර්ශනය



- ❖ බුදු දහමේ ප්‍රධාන ග්‍රන්ථය ත්‍රිපිටකය යි.
- ❖ බෞද්ධාගම දර්ශනයකි.
- ❖ බෞද්ධ දහමේ මූලික ඉගැන්වීම චතුරාර්ය සත්‍යය වේ.

දුක
දුකට හේතුව.
දුක නැති කිරීම.
දුක නැති කිරීමේ මාර්ගය වේ.

- පාලි භාෂාවෙන් (මගදි භාෂාව) රචිත ත්‍රිපිටකය

  සූත්‍ර,
  විනය,
  අභිධර්මය යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

- ධම්ම පදය හා ජාතක පොත බෞද්ධාගමිකයින්ට වැදගත් ග්‍රන්ථයන් දෙකක් වේ.

- ආගමික උත්සව අතර වෙසක් උත්සවය, පොසොන් උත්සවය සහ පෝය දිනයන් වැදගත් තැනක් ගනී.

- බෞද්ධ දර්ශනයේ වැදගත් ම ඉගැන්වීම වන්නේ, විමුක්තිය උදාකර ගැනිමට තමන් විසින් ම වෙහෙස දැරිය යුතු බවත් තමා විසින් ම එය ළඟා කරගත යුතු බව ය.

## හින්දු ආගම



- හින්දු ආගමිකයන්ගේ ප්‍රධාන ග්‍රන්ථය වේද ග්‍රන්ථය යි

- ශිව දෙවිඳුන්ට හා විෂ්ණු දෙවිඳුන්ට වන්දනා මාන කිරීම මූලික වේ.

- වේද ග්‍රන්ථ, ඍග්, යජුර්, සාම, අථර්වන් ලෙසින් කොටස් හතරකින් සමන්විත වේ.

- ඉහත ග්‍රන්ථ හතර නැවත ප්‍රධාන කොටස් හතරකට බෙදේ එනම්,

  ස්තෝත්‍ර
  බ්‍රාහ්මණ
  ආරාණ්‍යයක
  උපනිෂද් යනුවෙනි .

- හින්දු භක්තිකයින්ගේ ආගමික උත්සව අතර තෛපොංගල් උත්සවය, මහා ශිව රාත්‍රී උත්සවය, දීපාවලී උත්සවය වැදගත් තැනක් හිමි කර ගනියි.

- හින්දු භක්තිකයන්ගේ අවසාන අරමුණ වන්නේ දෙවිඳුන් සමග එකතු වීමයි. හින්දු බැතිමතුන් තුළ පවිත්‍රත්වය, ආත්ම සංයමය, ලෞකික ඇලීම්වලින් තොර වීම සත්‍යය හා අවිහිංසාව වර්ධනය කිරිම හින්දු ආගමේ පරමාර්ථ වේ.

## ඉස්ලාම් ආගම



- ඉස්ලාම් ආගමේ ප්‍රධාන ආගමික ග්‍රන්ථය කුරාණය වේ.
- ඒක දේවවාදී ආගමකි.
- ඔවුහු අල්ලාහ් දෙවිඳුන්ට නමස්කාර කරති.
- මුහම්මද් නබිතුමාට වරින්වර "අල්ලාහ්" දෙවිඳුන් ප්‍රකාශ කළ ඉගැන්වීම් කුරාණයේ අන්තර්ගත ව ඇත.
- මුහම්මද් නබිතුමාගේ දේශනා 'අස්සුන්තා' නම් ග්‍රන්ථයේ පළ වී ඇත.
- ඉස්ලාම් ආගමේ උත්සව අතර මිලාඩ් උන් නබි උත්සවය, රාමසාන් උත්සවය හා හජ් උත්සවය ප්‍රධාන තැනක් ගනියි.
- මුළු මිනිස් සමාජය එක පවුලක් යන ආකල්පය ඉස්ලාම් බැතිමතුන් තුළ ඇත.
- අල්ලාහ් දෙවිඳුන් කෙරේ පමණක් විශ්වාසය තබා යහපත් ලෙස ජීවත් වීමෙන් ස්වර්ග රාජ්‍යය හිමිකර ගත හැකි බව ඔවුන්ගේ විශ්වාසයයි.

ඉහත කරුණු දෙස සලකා බැලීමේ දී විවිධ ආගම් අතර විවිධත්වයක් පවතින අතර ම එකඟ විය හැකි අවස්ථා හා කාරණා ද ඇත. එබැවින් වඩා යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා සියලු දෙනා එක්ව ක්‍රියා කිරීම අවශ්‍ය වේ. සෑම ආගමකින්ම ඉස්මතු වන උතුම් ගුණාංග තේරුම් ගෙන අන් ආගමිකයන් සමග සහෝදරත්වයෙන් කටයුතු කළ යුතු ය

තවද සියලු ආගම් සඳහා විවිධ වූ ආගමික උත්සව පැවැත්වෙනු ඇත. විවිධ වූ කාරණාවන් අරමුණු කර ගනිමින් විවිධ සංස්කෘතීන් අනුගමනය කරමින් එම උත්සව සංවිධානය වේ. එවැනි විවිධ ආගමික උත්සව අවස්ථා හා අවශ්‍යතාවල දී ආගමික වෙනස්කම් බාධාවක් කර නොගනිමින් ක්‍රියා කිරීම අවශ්‍ය වෙයි. එවැනි අවස්ථාවන්ට පාසලේ දී හෝ සාමාජයේ දී සහභාගී වීමට කිතුනු ඔබට සිදු වනු ඇත. එවිට අපගේ ආගමික අනන්‍යතාව රැක ගනිමින්, අන් ආගම්වලට ගරු කරමින් සෙසු ආගම් සමග සහජීවනයෙන් කටයුතු කිරීමෙන් ඊට සහභාගි වීම වැදගත් ය.

## ක්‍රියාකාරකම

1. ඔබේ පන්තියේ අන්‍ය ආගමික මිතුරකුට හෝ මිතුරියකට කිතුනු දහම පිළිබඳ ව ඔබ ප්‍රකාශ කරන විශේෂිත කාරණා 5 ක් ලියන්න.

2. විවිධ ආගමික උත්සව සඳහා ඔබට දායක විය හැකි ආකාර 3 ක් ලියන්න.